ජයසිංහ, ජේ. එම්. ප්‍රතිභා මධුරංගි

*Paper: Transformability*

## ශ්‍රී ලංකාවේ ජ්‍යොතිර්වේදීන් සතු ජ්‍යොතිෂ්‍ය ඥානයේ ව්‍යුහය පිළිබඳ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන් කෙරෙන ගවේෂණාත්මක අධ්‍යයනයක්


ජ්‍යොතිර්විද්‍යාව විශ්වයේ දිසි නොදිසි සියලු වස්තූන් හා මිනිසා අතර පවතින අන්‍යෝන්‍ය බලපෑම අවබෝධ කරගැනීමට අවකාශ සලසයි. ජ්‍යොතිර්වේදීන් සතු ජ්‍යොතිෂ්‍ය ඥානයේ ව්‍යුහය ජ්‍යොතිෂ්‍ය, වාස්තු විද්‍යාව, නිමිති ශාස්ත්‍රය, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, ශාන්තිකර්ම හා විවිධ පුදපූජා, නාඩි ශාස්ත්‍රය, යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රය, හස්ත රේඛා ජ්‍යොතිෂ්‍ය, දේහ ලක්ෂණ විද්‍යාව, කූප ශාස්ත්‍රය, වශී ගුරුකම් හා හූනියම් බන්ධන, පේන කීම ලෙස හඳුනාගත් දැනුම් ක්ෂෙත්‍ර 12 ක් ඔස්සේ සොයාබලා විග්‍රහකර ඇත. ජ්‍යොතිර්වේදීහු සමාජ පිළිගැනීම, ආර්ථික වාසි, පහසුව ආදී කරුණු මත පදනම්ව විවිධ ඥාන ක්ෂෙත්‍ර සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී කටයුතු කරති.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විසිරී පවත්නා ජ්‍යොතිෂ්‍ය ඥාන මූලාශ්‍ර හඳුනාගැනීම සහ ඔවුන් සතු ජ්‍යොතිෂ්‍ය ඥානයේ ව්‍යුහය හඳුනාගැනීම, එහි ව්‍යවහාරය හා භාවිතය, විශේෂඥතාවය, සම්ප්‍රේෂණයවන ආකාරය හඳුනා ගැනීම හා එම ජ්‍යොතිෂ්‍ය ඥාන ක්ෂෙත්‍ර සංරක්ෂණය කර ඉදිරියට කාලෝචිතව පවත්වාගෙන යාම, සඳහා ක්‍රියා මාර්ග සොයා බැලීම පිළිබඳව මෙම අධ්‍යයනයේදී අවධානය යොමුකර ඇත.

ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් දත්ත එක්රැස් කර ගුණාත්මකව විශ්ලේෂණය කර ඇති අතර අවශ්‍ය විටදී සංඛ්‍යාත්මක වගු හා ප්‍රස්තාර උපයෝගී කරගෙන ඇත. ජ්‍යොතිෂ්‍ය පිළිබඳව 50%ක් විශේෂඥතාවය දක්වන අතර 20%ක් යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රය හා 10% බැගින් වාස්තු විද්‍යාව, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, ශාන්තිකර්ම හා විවිධ පුදපූජා පිළිබඳව විශේෂඥතාවය දක්වයි. ජ්‍යොතිෂ්‍ය, කූප ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, වාස්තු විද්‍යාව, ශාන්තිකර්ම හා විවිධ පුදපූජා යන ඥාන ක්ෂෙත්‍ර වර්තමානයේ සක්‍රීයව භාවිත වෙයි.

දැනුම ලබා දීම බහුතරයක් පාරම්පරිකව මුඛ වහරින් පවත්වාගෙන යන අතර ගුරු - ගෝල සම්බන්ධතා හා ස්වයං අධ්‍යයනයන් මගින් ද සිදුකෙරේ. මෙහි අනාගත පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින අතර තරුණ පරපුර එය වෘත්තියක් ලෙස හඳුනා ගැනීමට මැලිකමක් දක්වයි. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල මෙහෙයවීමෙන් මේ පිළිබඳව පර්යේෂණ හා අත්හදා බැලීම් සිදු කර ජ්‍යොතිෂ්‍ය ඥානය සංරක්ෂණය කළ යුතුව ඇත.


**මූලික පද:** **ජ්‍යොතිෂ්‍ය ඥානය, දේශීය දැනුම, වාස්තු විද්‍යාව, කූප ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය**